# පඤ්චශීලය ආධ්‍යාත්මික සංවර්ධනයට කෙසේ උපකාරී වේද?

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක
කැළණියේ අජිත හිමි

බුදුසමයෙහි දක්වෙන ආධ්‍යාත්මික සංවර්ධනයෙහි මූලික අඩිතාලම ලෙස පඤ්ච සීලය පෙන්නුම් කළ හැකිය. සැම තිසරණ ගත උපාසක-උපාසිකාවක විසින්ම මෙය පිළිපැදිය යුතු අංග පසක් ලෙස දක්වා ඇත. එම අංග පහ නම්—

(i) සතුන් මැරීමෙන් වැලකීම
(ii) සොරකම් කිරීමෙන් වැලකීම
(iii) කාමයේ වරදවා හැසිරීමෙන් වැලකීම
(iv) බොරුකීමෙන් වැලකීම
(v) මත්පැන් පානයෙන් වැලකීම යන කරුණුය

විමුක්තිය ලැබීම සඳහා මේවා දියුණු කළ යුතු බව බුදුදහමෙහි දක්වේ. ඉන් තෘෂ්ණාක්ෂය වීම අදහස් කෙරෙයි. සීල සමාධි ප්‍රඥ යන්නෙහි මුලින්ම දක්වා ඇති භේදය සීලයයි. සීලය නිසා සිතෙහි සමාධියත්, සමාධිය නිසා විදර්ශනා ප්‍රඥවත් උපදින බව බුද්ධ ධර්මයෙහි සඳහන් වේ. සූත්‍ර පිටකයෙහි දීඝ නිකායට අයත් චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි එන සක්විති දහම ගොඩනැගී ඇත්තේද මේ පඤ්ච ශීලය මතය. සතුන් මැරීම යන මෙහි "සත්ව" යන වචනයට මිනිසා පමණක් නොව සියලුම ජීවීහු අයත් වෙති. සත්ව හිංසාව සැම ආගම් විසින්ම ප්‍රතික්ෂේප කරන අතර සමාජය පිළිගත් දුසිරිතකි එය. ගස් වැල් හා බීජ වර්ගද ජීවී සංඛ්‍යාවෙහිලා සැලකෙති. මේ නිසා බෞද්ධ විනය අනුව ගස්වැල් ආදිය කැඩීම විනයෙහිද වරද බව සඳහන් වේ.

ලෝභ ද්වේෂ මෝහ යන අකුසල් තුන සැම පාප කර්මයකටම මූලික වේ. මෙයින් ප්‍රාණ ඝාතය ප්‍රධාන වශයෙන් ද්වේෂය මූලික කරගෙනද සොරකම ලෝභය මුල්කර ගෙනද කාම මිථ්‍යාචාරය කාම තණ්හාව මුල් කරගෙනද බොරුකීම වංචනික ලොභය මුල්කරගෙනද මත්පැන් පානය මෝහය මුල්කරගෙනද කරනු ලබයි.

මිනිසාට මෙන් තිරිසනාටද ජීවත්වීමේ අයිතියක් ඇත.

සබ්බෙ තසන්ති දණ්ඩස්ස — සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා — නහනෙය්‍ය නඝාතයෙ

යන මේ දහම් පදයයෙන් උගන්වා ඇත්තේ තමා උපමා කොට අනුන්ට හිංසා නොකරන ලෙසය. ඇතැම් ආගම් හා රාජ්‍ය නීතිවලින් මිනිස් ඝාතනය පමණක් තහනම් කර ඇත. එවිට සන්තානයෙහි ඇති දඬුවමට බිය හා නීතියට ඇති බිය නිසා එයින් වැළකෙයි. නමුත් බුදුදහමෙහි තමා එයට අකැමැති බව පෙන්නුම් කර අන් අයගේ එම තත්වයද පැහැදිලි කොට පෙන්වා දෙයි. "සබ්බෙ භායන්ති මච්චුනො" යන්නෙන් එය පැහැදිලි කොට ඇත. ජෛන ආගමේ දැඩිව දක්වා ඇති අවිහිංසාවාදයද අන්තගාමී තත්වයට පත් නොවී බුදුදහමෙහිද දක්වා ඇත. රජකු හෝ රාජ්‍යයක් මගින් මහජනතාව කරුණු තුනක් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරයි. එනම් :

i ආරක්ෂාව
ii අඛණ්ඩව ජීවිතය ගෙනයාමට පහසුකම් සැලසීම
iii අවශ්‍යතාවන්ගෙන් ලබන තෘප්තිය

යන කරුණුය. මේවා ලබාදීමට හා ලබා ගැනීම සඳහා පංචශීල ප්‍රතිපත්තිය බෙහෙවින් ඉවහල් වේ. ලෝභ, ද්වේෂ, මෝහාදි අකුසල මූලයන් තුනී නොකර ආධ්‍යාත්මික සංවර්ධනයක්

ලැබිය නොහැක. ඇතැම් විට පස් පව් සිදු කිරීම සංසාරගත පුරුද්ද නිසාද එදිනෙදා ජීවත් වන සමාජයට අනුවද සිදුවේ. හිංසා සහගත අදහස් සන්තානයෙන් බැහැර වීමත් සමගම අවිහිංසාව පිළිබඳ අදහස් ඇතිවේ.

ද්වේෂ සහගත සිතිවිලි බැහැරවීමෙන් අව්‍යාපාද සංකප්පය ඇතිවේ. මේ ආදි වශයෙන් සලකන කල මධ්‍යම ප්‍රතිපදාව සේ දක්වන මාර්ගාඞ්ගයන් කෙරෙහිද පරපණ නැසීමෙන් වැලකීම සම්බන්ධ වේ.

මෙයින් දක්වෙනුයේ සියලු සත්වයා කෙරෙහි කරුණාව, මෛත්‍රිය ආදි ගුණ ධර්ම වැඩීමය. ගුණධර්ම යම් කෙනකුගේ හද තුල තිබේ නම් හෙතෙම පස්පව් කිරීමට නොපෙළඹෙයි. පංචශීලය තමාගේ සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට මෙසේ උපයෝගී කරගත හැකිය.

ලෞකික දිවිය පිළිබඳ මෙනෙහි කරන කල එදිනෙද ජීවිතය සඳහා උපභෝග, පරිභෝග වස්තු අවශ්‍ය වේ. මේවා සොරකම් කිරීම කෙනකුගේ අයිතිවාසිකම් උදුරා ගැනීමක් පමණක් නොව සොරාගන්නා තමාගේ යුතුකම් පැහැර ගැනීමත් කරයි. මෙයින් සිදුවනුයේ එකිනෙකාට බියෙන් ද්වේෂ සහගතව සිටීමයි. කෙනකු කෙරෙහි ද්වේෂ සහගතව හෝ භාණ්ඩය කෙරෙහි ලෝභ සහගතව සොරකම් කළ හැකිය. නමුත් මේ දෙකින් කුමක් මුල් වුවත් එය අකුසල් මූලයකි. එය පාපයකි.

කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලකීම යන සිකපදය යටතේ මිනිසාගේ දිවියෙහි නිදහස නැති කර ඇතැයි යමෙක් සිතයි නම් එය වැරදියි. සමාජයක් බිහිවීමේ මූලික ඒකකය පවුලයි. පවුලෙහි සාම කාමිත්වය රජයයි නම් එයින් යහපත් සමාජයක් බිහිවෙයි. එසේ පවුලේ සාමකාමිත්වයක් පැවතීමට නම් අඹුසැමියන් අතර අන්‍යෝන්‍ය විශ්වාසනීයත්වයක් තිබිය යුතුය. භාර්යාව ස්වාමියා කෙරෙහිත් සැමියා භාර්යාව කෙරෙහිත් මනා අවබෝධයක් හා මනා විශ්වාසයකුත් ඇතිකර ගත යුතුය. එවිට කාමයෙහි වරදවා හැසිරීම සිදුවීමෙන් වැළකිය හැකිවේ.

බොරුකීම නිසා එකිනෙකා කෙරෙහි ඇති අන්‍යෝන්‍ය විශ්වාසය බිඳී යයි. එකිනෙකා සමඟ ඇතිවන අදහස් හුවමාරුවේදී එය බාධාවකි. යමෙක් බොරුවක් කියනුයේ දෙදෙනකු බේද බින්න කිරීමේ අදහසින් හෝ යම් ලාභ ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙනි. යමෙක් වංචනික අදහස් දරමින් සමාජය බේද බින්න කර වන විට එයින් ආධ්‍යාත්මික සංවර්ධනයට බලවත් පහරක් එල්ල වෙයි. බොරුකීම අත්හැරීම නිසා සදචාර වර්ධනයට ඉවහල් වන කරුණු රැසක් සම්පූර්ණ වේ. ප්‍රිය තෙපුල් කියන්නා බොරු නොකියන්නෙකි. වචනයෙන් හා කයින් කරන හැම ක්‍රියාවකම මූලය සිතයි.

සිතින් උපදින චෛතසික මුලින්ම පිරිසිදු විය යුතුය. එසේ වීමට නම් සිතෙහි දියුණුවක් තිබිය යුතුය. එසේ කර ගැනීමට නම් අකුසල් මුල් යටපත් කළ යුතුය. එසේ යටපත් කිරීමට මූලික ශික්ෂණය ලබා දෙන්නේ පංචශීලයයි. සමාජය සදචාරවීමට නම් පුද්ගලයා නමැති ඒකකය සදචාර විය යුතුය. එවිට එක් එක් පුද්ගලයා සදචාර සම්පන්න වනු ඇත. මත්පැන් පානය හේතු කොට ගෙන මිනිසා ස්වාභාවික තත්ත්වයෙන් පලායයි. අමුතුම ලොවක් කරා යන ඔහුගේ ක්‍රියාදමය විපරීත තත්ත්වයට පත්වෙයි. හොඳ, නරක, යුතු අයුතුකම් තෝරා බේරා ගත නොහැකි තත්ත්වයට මිනිසා පත්වෙයි. මිනිසාගේ ආත්ම දමනය සම්පූර්ණයෙන්ම වාගේ රහමෙර පානය නිසා නැතිව යයි. කෙනෙක් මෙය පුරුද්දක් වශයෙන් කරනුයේ නම් එය ඔහුගේ ශාරීරික සෞඛ්‍යය කෙරෙහිද බලපායි. නූතන විද්‍යාඥයන්ගේ පර්යේෂණවලින් පවා මෙය ඔප්පු වී ඇත. ශරීර සෞඛ්‍යයට බාධා පැමිණෙන විට ආධ්‍යාත්මික තත්ත්වයද ක්‍රමයෙන් හීන තත්ත්වයට පත්වෙයි.

පන්සිල් නොරකින පුද්ගලයාගේ ජීවිතය, ධනය, අඹු දරුවන්, නිලතල ආදියද විනාශය කරා ගමන් කරයි. තම බාහිර වස්තු විනාශය කරා යන විට සිත කලකිරීම නිසා ආධ්‍යාත්මික ගුණ දහම ඔහුගෙන් ඈත්වෙයි. ඇතැම් අයට මේ කලකිරීම පිළිබඳව යථාර්ථය වැටහීම හේතු කොට ගෙන සසුන වෙත බරවී ආගමික දිවිපෙවෙත ගෙවන අවස්ථාද නැත්තේ නොවේ. පන්සිල් රකින පුද්ගලයා තුල සතර බ්‍රහ්ම විහාර ගුණ හා අරි අටගි මගෙහි ඇතැම් මාර්ගාඞ්ග පහළ වෙයි. එයින් හෙතෙම දශ පුණ්‍ය ක්‍රියාවලට නැඹුරු වී ආධ්‍යාත්මික සංවර්ධනය කරා පිය නගයි.

මේ පංච ශීලය ආරක්ෂා කළ යුත්තේ හුදෙක් පරාර්ථය සඳහාම නොවේ. එහි බලපෑම තමා වෙතද තිබිය යුතුය.

බෞද්ධ දර්ශනය අනුව මෛත්‍රිය නිසා සමාධිය නිසා ප්‍රඥව ඉවසීම ආදි ගුණ ධර්ම ඇතිවේ. මෛත්‍රිය පමණක්ම නිවන සඳහා උයයෝගී නොවුවත් එයින් ආධ්‍යාත්මික ගුණ ධර්මවල වර්ධනයක් ඇතිවේ. ලෞකික වූද ලෝකොත්තර වූද ගුණ දහම් වඩා වර්ධනය කර ගැනීම සඳහා පන්සිල් බොහෝ සෙයින්ම උපකාරී වේ. මේ ආදි කරුණු සලකා බලන විට **පන්සිල්** නම් සෑම සමාජයක්ම යහපත් සේ සලකන ගුණ ධර්ම පහකි. එයින් සමාජයෙහි ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කරන බව කවදත් නැණවතුන්ගේ පිළිගැනීමයි.

ආශ්‍රිත ග්‍රන්ථ:—

ධම්මපදය

නිවන් මග